කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre.

**2021 සැප්තැම්බර් මස 28 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2021 සැප්තැම්බර් මස 27 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

බස්නාහිර, සබරගමුව, මධ්‍යම සහ වයඹ පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි හෝ ගිගුරුම් වැසි ඇතිවේ. සබරගමුව පළාතෙත් මහනුවර, නුවරඑළිය, කළුතර, ගාල්ල සහ මාතර දිස්ත්‍රික්ක වල ඇතැම් ස්ථානවලට මි.මී. 50 ට වැඩි තරමක තද වැසි ද ඇතිවිය හැක.

ඌව පළාතේ සවස් කාලයේ හෝ රාත්‍රී කාලයේ ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.

ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

දිවයින හරහා විශේෂයෙන් මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශවලත්, උතුරු, උතුරු-මැද, වයඹ, දකුණ සහ බස්නාහිර පළාත්වල සුළගේ වේගය විටින් විට පැ.කි.මී.50 දක්වා වැඩි විය හැක.

## WEATHER FORECAST FOR 28 September 2021
## Issued at 12.00 noon on 27 September 2021

**Showers or thundershowers will occur at times in the Western, Sabaragamuwa, Central and North-western provinces and in Galle and Matara districts. Fairly heavy showers above 50 mm can be expected at some places in Sabaragamuwa province and in Kandy, Nuwara-Eliya, Kaluthara, Galle and Matara districts.**

**Showers or thundershowers may occur at a few places in Uva province in the evening or night.**

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

Wind speed can be increased up to 50 kmph at times over the island particularly in the western slope of central hills, Northern, North-Central ,North-Western, Southern and Western provinces.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය

**WEATHER AND STATE OF SEA AROUND THE ISLAND**

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය
2021 සැප්තැම්බර් මස 27 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.

උතුරු බෙංගාල බොක්ක ප්‍රදේශ ආශ්‍රිත මුහුදු ප්‍රදේශයේ පවතින 'ගුලාබ්' සුළි කුණාටුව ගැඹුරු පීඩන අවපාතයක් දක්වා දුර්වල වී දකුණු ඔඩිස්සා ආසන්න උතුරු ආන්ද්‍රා ප්‍රදේශයේ ස්ථාන ගතව පවතී.

උතුරු අක්ෂාංශ 15.0 සහ 20.0, නැගෙනහිර දේශාංශ 80.0 සහ 90.0 මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවික කටයුතුවල යෙදෙන විට මේ පිලිබඳව අවධානයෙන් කටයුතු කරන ලෙස අවවාද කරනු ලැබේ.

**වැසි තත්ත්වය:**

පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශ වල විටින් විට වැසි හෝ ගිගිරුම් සහිත වැසි ඇතිවේ. ඇතැම් ස්ථානවලට තද වැසි ද ඇතිවිය හැක. සෙසු මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවිය හැක.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං බස්නාහිර සිට නිරිත දෙසින් හමා එයි. සුළගේ වේගය පැ.කි.මී. (40-50) පමණ වේ. මන්නාරම සිට පුත්තලම, කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (60-70) පමණ දක්වා වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**

මන්නාරම සිට පුත්තලම, කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු හෝ ඉතා රළු වේ. සෙසු මුහුදු ප්‍රදේශ තරමක් රළු විය හැක.

පුත්තලම සිට කොළඹ, ගාල්ල සහ හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වන වෙරළ ආසන්න මුහුදු ප්‍රදේශවල මුහුදු රළ මීටර්. (2.0 - 2.5) ක් පමණ ඉහළ යාමේ හැකියාවක් ද පවතී.

එම මුහුදු ප්‍රදේශවල නැවත දැනුම් දෙන තුරු ධීවර සහ නාවුක කටයුතුවල නොයෙදෙන ලෙසද දැනට මෙම ප්‍රදේශයේ ස්ථානගතව සිටින අය වෙතොත් ආරක්ෂාකාරී ස්ථාන වෙත ගමන් කරන ලෙසද අවවාද කරනු ලැබේ.

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS**
**Issued at 12.00 noon on 27 September 2021**

**The cyclonic storm 'Gulab' weakened into a deep depression over north Andra Pradesh adjoining south Odisha.**

**Naval and fishing communities are advised to be vigilant in the sea areas around latitude 15.0N and 20.0N longitude 80.0E and 90.0E.**

**Condition of Rain:**

Showers or thundershowers will occur at times in the sea areas extending from Puttalam to Hambantota via Colombo and Galle. Heavy falls are likely at some places. Showers or thundershowers may occur at several places in the other sea areas around the island.

**Winds:**

Winds will be westerly to south-westerly in direction and wind speed will be (40-50) kmph in the sea areas around the island. The wind speed can be increased up to (60-70) kmph at times in the sea areas extending from Mannar to Pottuvil via Puttalam, Colombo, Galle and Hambantota.

**State of Sea:**

The sea areas extending from Mannar to Pottuvil via Puttalam, Colombo, Galle and Hambantota will be rough very rough at times. The other sea areas around the island may be fairly rough at times.

There is a possibility that near shore sea areas off the coast extending from Colombo to Pottuvil via Galle and Hambanthota may experience swell waves, having (2.0 - 2.5) m height.

**Naval and fishing communities are advised not to venture into the sea areas and those who are currently positioned within this area are advised to move on to a safer locations until further notice.**